# 70, 80 දශකවලට සාපේක්ෂ ව නූතන නාට්‍ය ජනගත නොවීම සම්බන්ධ ව විමසීමක්

එරංග කෞශල්‍ය ගොඩකන්ද ආරච්චි[1]

1956 මනමේ නාට්‍යය වේදිකාගත කිරීමත් සමඟ මෙරට නාට්‍ය කලාවේ කේන්ද්‍රීය වෙනසක් ඇති විය. මේ පුනරුදයත් සමඟ නාට්‍ය උගත් පිරිසගේ ප්‍රතිඵලය නාට්‍ය ක්ෂේත්‍රයට ලැබෙන්නට වූයේ 70, 80 දශකයන්හි දී ය. මේ දශක ද්විත්වයේ දේශපාලන, ආර්ථික වෙනස්වීම් ගණනාවක් ඇති විය. කලා ක්ෂේත්‍රයේ ද විශිෂ්ට නාට්‍ය නිර්මාණ රැසක් බිහි විය. එහෙත් ඒ නිර්මාණ අද දක්නට නොවීමත්, නාට්‍ය පෙළ මුද්‍රිත ව ප්‍රකාශ නොවීමත් නිසා අධ්‍යයනය කිරීමට ඉතිරි වී ඇත්තේ සීමා සහිත නාට්‍ය සංඛ්‍යාවකි. එකල නාට්‍ය පටිගත නොකිරීමත්, නාට්‍ය නැරඹූ ප්‍රේක්ෂකයන්ට පූර්ණ මතකයක් නොතිබීමත් නිසා අධ්‍යයනය කිරීමට එක ම මඟ වී ඇත්තේ ජීවත් ව සිටින නාට්‍යකරුවන් සමඟ සාකච්ඡා කිරීම හා ප්‍රකාශයට පත් වී ඇති නාට්‍ය කෘති අධ්‍යයනය කිරීම පමණි. ඇතැම් විද්වතුන්ගේ පර්යේෂණයන්හි නිගමනයන්ට අනුව, 70, 80 දශකවල නාට්‍ය සාර්ථක වී ඇත්තේ එකල පැවති අධ්‍යාපනික හා සංස්කෘතික පදනම නිසා බව සඳහන් කර තිබේ. තව ද එදිරිවීර සරච්චන්ද්‍ර, සුගතපාල ද සිල්වා, ගුණසේන ගලප්පත්ති, දයානන්ද ගුණවර්ධන වැනි විශිෂ්ටයන්ගේ නාට්‍ය ඇසුර ලත් ශිල්පීන් නාට්‍ය කලාවට සම්බන්ධ වීමත් ය. නවීන හා ප්‍රවීණ නාට්‍යකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙනුත්, 70, 80 දශකවල හා වර්තමානයේ වේදිකාගත නාට්‍ය කෘති සංසන්දනය කිරීමෙනුත්, කෙරුණු මේ පර්යේෂණයෙන් පැහැදිලි වන්නේ 70, 80 දශකවලට සාපේක්ෂ ව 2010 සිට 2015 දක්වා වේදිකාගත වූ වර්තමාන නාට්‍ය ජනගත නො වන බව යි. ඊට හේතු රාශියක් හඳුනාගත හැකි ය. ඒ අතුරින් 1978 ආරම්භ වූ විවෘත ආර්ථිකයේ ප්‍රතිඵල ප්‍රබල ලෙස බලපෑම, හැම නිවෙසකම පුංචි තිරය හෙවත් රූපවාහිනියක් තිබීම, ටෙලිනාට්‍ය කලාව ව්‍යාප්ත වීම, යුද්ධය හා තරුණ අරගල, ආර්ථික ලාභය පමණක් සිතා නාට්‍ය නිර්මාණය කිරීම, පුද්ගල බද්ධතාව මත සම්මාන ප්‍රදානය කරන රාජ්‍ය නාට්‍ය උළෙලක් වර්තමානයේ ක්‍රියාත්මක වීම, උසස් රසිකත්වයෙන් හීන ප්‍රේක්ෂකයන් බහුල වීම, යනාදි හේතු ඒ අතර වේ. එමඟින් වර්තමාන නාට්‍ය කලාව 70, 80 දශකවලට සාපේක්ෂ ව ජනගත නො වන බව අනාවරණය වේ.

**ප්‍රමුඛ පදඃ** දයානන්ද ගුණවර්ධන, ටෙලිනාට්‍ය, යුද්ධය, සුගතපාල ද සිල්වා, මනමේ

---

[1] සිංහල අධ්‍යයනාංශය